# විශේෂ නිවේදනයයි.

ඊශ්‍රායලයේ වාසය කරන ශ්‍රී ලංකාව බලා යාමට බලාපොරොත්තු වන සියලුම ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත,

## විදේශගත ශ්‍රී ලාංකිකයන්/සංචාරකයින් කොරෝනා (COVID -19) වසංගත කාලය තුළ ශ්‍රී ලංකාවට පැමිණීමේදී අදාල වන ශ්‍රී ලංකා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද නව නිරෝධායන නීතිරීති

විදේශගත ශ්‍රී ලාංකිකයන්/සංචාරකයින් කොරෝනා (COVID -19) වසංගත කාලය තුළ ශ්‍රී ලංකාවට පැමිණීමේදී අදාල වන ශ්‍රී ලංකා විදේශ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2021.04.06 දිනැති මාධ්‍ය නිවේදනයෙන් ඔබ වෙත දැනුම් දෙන ලද කරුණුවලට අමතර වශයෙනි.

ඒ අනුව ශ්‍රී ලංකා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2021.04.06 දින සිට පහත සදහන් නව නීති රීති හදුන්වා දී ඇත.

### පොදු කොන්දේසි

### ශ්‍රී ලංකාවට පැමිණීමට අනුමැතිය ලබාගැනීම

1. **ශ්‍රී ලාංකිකයන්**( ගුවන් මගින් පැමිණෙන ශ්‍රී ලාංකික නාවිකයින්ද ඇතුළුව) **හෝ ද්විත්ව පුරවැසියන්** ( ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය භාවිතා කරන්නේ නම්) **ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු නම්කරන ලද නිරෝධායන හෝටලයක නවාතැන්ගනු ලබන්නේ නම් ඔවුන් විදේශ අමාත්‍යාංශයේ හෝ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ පූර්ව අවසරය ලබාගැනීම අවශ්‍ය නොවේ.**ඔවුන්ට නිරෝධායන හෝටලයක නවාතැන් පහසුකම් වෙන්කරවා ගෙන ගුවන් සමාගම් හා සම්බන්ධ වී ශ්‍රී ලංකාවට පැමිණීමට හැකිය.

2. **ශ්‍රී ලාංකිකයන්**( ගුවන් මගින් පැමිණෙන ශ්‍රී ලාංකික නාවිකයින්ද ඇතුළුව) **හෝ ද්විත්ව පුරවැසියන්** ( ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය භාවිතා කරන්නේ නම්) **ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු රජයේ නිරෝධායන මධ්‍යස්ථානයක නවාතැන්ගනු ලබන්නේ නම්, ඔවුන් ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර විදේශ අමාත්‍යාංශයේ (E-mail – entry.permission@mfa.gov.lk)පූර්ව අවසරය ලබාගැනීම අත්‍යාවශ්‍ය වේ.**

3. **ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය** (Sri Lanka Tourism) **හරහා පැමිණෙන සංචාරකයින්** ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර https://www.srilanka.travel/helloagain/. වෙබ් අඩවිය හරහා අයදුම් කර ඒ සඳහා අවශ්‍ය පූර්ව අනුමැතිය ලබාගත යුතුය. **විදේශීය සංචාරකයින්/විදේශිකයින්** (වලංගු නේවාසික වීසා සහිත)/**ද්විත්ව පුරවැසියන්/**

ශ්‍රී ලාංකිකයන් හටද ශ්‍රී ලංකා සංචාරක **මණ්ඩලය** (Sri Lanka Tourism) **හරහා ශ්‍රී ලංකාවට පැමිණීමට හැකි අතර ඒ සඳහා විදේශ අමාත්‍යාංශයේ පූර්ව අවසරය ලබාගැනීම අවශ්‍ය නොවේ.** ඔවුන් ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ මාර්ගෝපදේශ සහ COVID -19 පැතිරීම වැලැක්වීමට අදාල සෞඛ්‍ය අමාත්‍යාංශයේ රෙගුලාසි පිළිපැදිය යුතුය.

**4.ද්විත්ව පුරවැසියන්** ( ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා විදේශීය ගුවන් ගමන් බලපත්‍ර භාවිතා කරන්නේ නම්) සහ **විදේශිකයන්** ( වලංගු නේවාසික වීසා සහිත) ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය(Sri Lanka Tourism) හරහා ශ්‍රී ලංකාවට **නොපැමිණෙන්නේ නම්,** ඔවුන් ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර විදේශ අමාත්‍යාංශයේ **(E-mail – entry.permission@mfa.gov.lk)** පූර්ව අවසරය ලබාගැනීම අත්‍යාවශ්‍ය වේ.

5. **විදේශිකයින් ශ්‍රී ලංකා රජයේ / පුද්ගලික සංවිධානයක ආරාධනාවක් මත වැදගත් ව්‍යාපෘති/රැස්වීම්/සාකච්ඡා සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන්නේ නම් ඔවුන් ඒ පිළිබඳ අදාල විස්තර සහ ආරාධනාපත් ද ඉදිරිපත් කර ශ්‍රී ලංකා විදේශ අමාත්‍යාංශයේ (E-mail – entry.permission@mfa.gov.lk)පූර්ව අවසරය ලබාගැනීම අත්‍යාවශ්‍ය වේ.**

**ශ්‍රී ලංකාව බලා පිටත්වීමට පෙර (Pre Deaprture) අවශ්‍ය වන COVID-19 සෘණ ප්‍රතිඵල වාර්තා**

ශ්‍රී ලංකාවට පැමිණෙන සියළුම ගුවන් මගීන් පහත සඳහන් පරිදි COVID-19 සෘණ ප්‍රතිඵල වාර්තා ඉංග්‍රීසි භාෂාවෙන් රැගෙන පැමිණීම අනිවාර්ය වේ.

**ශ්‍රී ලාංකික පුරවැසියන්**

ගුවන් ගතවීමට පැය 48 ක් ඇතුළත ලබාගත් රැපිඩ් ඇන්ටිජන්(Rapid Antigen) වාර්තාව හෝ පැය 96 ක් ඇතුළත ලබාගත් PCR වාර්තාව

**විදේශීය ගුවන් ගමන් බලපත් හිමිකරුවන් සහ ද්විත්ව පුරවැසියන්**

ගුවන් ගතවීමට පැය 96 ක් ඇතුළත ලබාගත් සෘණාත්මක PCR වාර්තාව

**සටහන :** ගුවන් සමාගම් විසින් ගුවන් ගත වීමට පෙර පැය 72ක් ඇතුලත ලබාගත් PCR සෘණාත්මක වාර්තාවක් ලබාදෙන ලෙස ඉල්ලා සිටිය හැකි බවද කරුණාවෙන් සලකන්න.

**COVID -19 එන්නත් සහතිකය/කාඩ්පත**

COVID -19 එන්නත් නියමිත මාත්‍රාවන් ලබා ඇති ගුවන් මගීන් ඔවුන් COVID -19 එන්නත ලබා ගත් බව සඳහන් මුල් (original) සහතිකය/කාඩ්පත (සහතිකය/කාඩ්පත ඉංග්‍රීසි නොවන වෙනත් භාෂාවකින් ඇත්නම්/අදාල දත්ත ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් කර නොමැති නම් සහතික කරන ලද පරිවර්තනයක් තිබිය යුතුය.) හෝ එන්නත් ලබාගත් බව සනාථ කළ හැකි වෙනත් ලේඛන රැගෙන පැමිණිය යුතුය.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
ටෙල් අවිව්, ඊශ්‍රායලය.

2021.04.07